# බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව.

ස්ථානය : බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2008.09.25

වේලාව : පෙ.ව.10.45

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

01. ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා

02. ගරු නගර සභා මන්ත්‍රී- ධර්මසේන සමරසිංහ මැතිතුමා.
03. ගරු නගර සභා මන්ත්‍රී- ආර්.ජේ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා
04. ගරු නගර සභා මන්ත්‍රී- ඩබ්.ජේ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා
05. ගරු නගර සභා මන්ත්‍රී- එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
06. ගරු නගර සභා මන්ත්‍රී- විමලසේන වැවේගෙදර මැතිතුමා.
07. ගරු නගර සභා මන්ත්‍රී- එම්.ටී.එම්.රූමි මැතිතුමා

**නිලධාරී සහභාගීත්වය:-**

01. ප්‍රධාන කළමණාකරණ සහකාර එම්.එච්.සීලවතී මහත්මිය.

**සහභාගීනොවූවෝ:-**

01. ගරු උපසභාපති - සුමේද චමින්ද බස්නායක මැතිතුමා

(01) **ආගම සිහිකිරීම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

ගරු සභාපතිතුමා කථා කරමින්, අද දින පැවැත්වෙන්නේ 2008 වර්ෂයේ සැප්තැම්බර් මාසයට අදාළ සභා රැස්වීම බවත්, ඒ සඳහා සහභාගිවීමට පැමිණ සිටින , ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා,ලේකම්තුමා වෙනුවට සභාවේ වැඩ ආවරණය කරනු ලබන ප්‍රධාන කළමණාකරණ සහකාර මහත්මිය හා පුවත්පත්කලාවේදී මහතුන් ගරු සභාපතිතුමා විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කසල කළමණාකරණ කටයුතු සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා පොළව කොන්ක්‍රීට් කිරීම iV අදියරෙහි වැඩ ආරම්භ කිරීම සඳහා 2008.09.19 දින ටෙන්ඩර් විවෘත කල අතර, බලන්ගොඩ මහජන පොළ ඉදිකිරීම 1 අදියර සඳහා ද 2008.09.10 වන දින ටෙන්ඩර් විවෘත කරනු ලැබූ අතර ඉදිරියේ දී මෙම කර්මාන්ත වැඩ ආරම්භ වනු ඇතැයි පැවසීය.

ජාතික සවිය , ගම නැගුම ,මග නැගුම වැඩ සටහන් යටතේ ඉටුකල කර්මාන්ත වල වැඩ අවසන් වෙමින් පවතින බවද සඳහන් කල ගරු සභාපතිතුමා , වසර ගණනාවක සිට මෙම සභාවේ පුරප්පාඩුව පැවති ගණකාධිකාරි ධූරය සඳහා ගණකාධිකාරි වරයෙකු පත්කර එවා ඇති බවත්, එම නිසා සභාවේ වැඩ කටයුතු ඉතා හොඳින් කරගෙන යාමට එම නිලධාරි මහතාගේ සේවය අප වෙත ලබාදෙනු ඇතැයි තමන් අපේක්ෂා කරන බව දන්වමින් සභාවේ ඉදිරි වැඩ කටයුතු ආරම්භ කරන ලෙස ප්‍රධාන කළමණාකරණ සහකාර නිලධාරි වෙත දන්වන ලදී.

(03). <u>2008.08.28 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:</u>

2008.08.28 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නගර සභා මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

(04) <u>පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම:</u>

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවිය.

05. <u>සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම.</u>

05:01 <u>37-7933 දරණ ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීම:</u>

උක්ත කරුණට අදාළව, විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති 2008.09.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ඉහත අංක දරණ ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීමට ඩිපෝ ඉංජිනේරු මහතාගේ නිර්දේශයට යටත්ව එහි ඇන්ජිමේ කලයුතු අලුත්වැඩියාවට අවශ්‍ය වන අමතර කොටස් සඳහා දල ඇස්තමේන්තුවක් ලබාගන්නා ලද අතර, එහි වටිනාකම රුපියල් එක් ලක්ෂ විසිදහසක් පමණ වන බවත්, මේ සඳහා අනුමත ගරාජයකින් අදාල අලුත්වැඩියාව ප්‍රධාන ලේකම්ගේ අනුමැතියට යටත්ව සිදුකිරීමට එමගින් උපදෙස් ඉල්ලා තිබිණ.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව, පිළිගත් ප්‍රාදේශීය ගරාජවලින් මිළ ගණන් ලබාගෙන නිෂ්පාදිත රටෙන් ගෙන්වනු ලබන අමතර කොටස් යොදා සම්පූර්ණ අලුත්වැඩියාවක් සිදුකිරීම සුදුසු බවටත්, මේ සඳහා ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමටත් තීරණය කරන ලදී.

05:02 <u>බස්නැවතුම්පල රැඳවුම් ගාස්තු සමඟ ටෙන්ඩර් කල කඩ කාමර වල කුලී මුදල් අයකිරීම:</u>

බලන්ගොඩ නව බස්නැවතුම්පලේ කඩ කාමර වල කඩ කුලී විශාල ප්‍රමාණයක් අයවීමට ඇති බවත්, එක් මසකවත් කඩකුලී නොගවූ අය කිහිපදෙනෙකු සිටින බවත්, මෙම සියළු දෙනාට ලිඛිතව හා වාචිකව කිහිපවතාවක් දන්වා ඇති අතර, සභාව විසින් සකස් කර ඇති බදු ගිවිසුම් අත්සන් නොකිරීම කඩකුලී නොගෙවීමට හේතුවක් වී ඇති බවත්, එබැවින්, ගිවිසුම් අත්සන් කර නීත්‍යානුකූලව කඩ කාමර පවරාගැනිම හෝ නඩු පැවරීම සුදුසු බව සඳහන් කරමින් ආදායම් අංශයෙන් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, කීමනි පදනම මත ලබාදුන් කඩ කාමර වල කුලිය නොවැම්බර් 31 දිනට පෙර ගෙවන ලෙසත්, මාස 06 ක කුලී පදනම මත ලබාදුන් කඩ කාමර වල කුලිය 10 වෙනි දිනට පෙර ගෙවන ලෙසත්, දඩ මුදල් අයනොකිරීම සුදුසු බවටත් තීරණය කරන ලදී.

05:03 **<u>බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කසල කළමණාකරණ කටයුතු සඳහා ගොඩනැගිල්ලක් හා පොළොව කොන්ක්‍රීට් කිරීම iV අදියර :</u>**

උක්ත කරුණට අදාළව විෂය භාර නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මධ්‍යම පරිසර අධිකාරියේ ජාතික පිළිසරු ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කසල කළමණාකරණ කටයුතු සඳහා ගොඩනැගිල්ලක් හා පොළව කොන්ක්‍රීට් කිරීම iV අදියර කර්මාන්තයේ ලංසු සම්බන්ධව 2008.09.22 දින පැවැති ඇගයීම් කමිටුවේ දී කර ඇති නිර්දේශයන් සහිත වාර්තාව සමගින් , කොන්ත්‍රාත්තුව පිරිනැමීම සම්බන්ධව තීරණයක් ගනු පිණිස සභාවට ඉදිරිපත් කර තිබුණි.

මේ සම්බන්ධව සාකච්ඡා කළ සභාව, කමිටුවේ නිර්දේශය ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

05:04 **<u>දීමනාව වැඩිකර ගැනීම ජ් ජේ.සී.බී.යන්ත්‍ර ක්‍රියාකරු.</u>**

මෙම නගර සභාවේ ජේ.සී.බී.යන්ත්‍ර ක්‍රියාකරු ලෙස සේවය කරනු ලබන කේ.ඩී.මංජුල ප්‍රසන්න මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ජේ.සී.බී.යන්ත්‍රය සේවාවේ නොයොදවන අවස්ථාවල දී තමාට කිසිදු වැටුපක් හෝ දීමනාවක් නොලැබෙන හෙයින්, දැනට ලබාදෙනු ලබන වැටුප වැඩිකර දෙන ලෙස එමගින් ඉල්ලා තිබිණි.

ජේ.සී.බී.යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා ගරාජයන් වෙත යොමු කර ඇති දියත්හි පමණක් රියදුරෙකුගේ දෛනික වැටුප ගෙවීම සුදුසු බවට තීරණය කරන ලදී.

05:05 **<u>දිරා නොයන අපද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා වැඩ සටහනක් සකස් කිරීම:</u>**

උක්ත කරුණට අදාළව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් ඉදිරිපත් කර ඇති 2008.09.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.

නගර සභා බල ප්‍රදේශය තුළ දිරා නොයන අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩ සටහනක් පාසල් මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ඉල්ලා තිබෙන අතර, පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ද වාර්තා කර තිබිණි.

01. නගර සභාවේ දිරා නොයන අපද්‍රව්‍ය මිළදී ගන්නා ස්ථානයකට අවශ්‍ය වීදුරු අල්මාරියක් සැපයීම හා එම ස්ථානයට රු.25000/- වටිනා පාසල් උපකරණ ලබාදීම .

02. නගර සභා සීමාව තුළ පාසල් වල ශිෂ්‍ය නායක නායිකාවන් හා පරිසර හට කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩ සටහන් 02 ක් පැවැත්වීම.

03. පාසල් මට්ටමින් දිරා නොයන අපද්‍රව්‍ය එකතු කිරීම.

නගර සභාවේ පිළිසරු මධ්‍යස්ථානයට ගෙන ඒම.

05. පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩ සටහන් 12 ක් පැවැත්වීම.
06. මේ සඳහා වැයවන මුදල කොම්පෝස්ට් ව්‍යාපෘති ගිණුමෙන් දැරීම.

මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

05:06 **පැරණි බිල්පත් සඳහා මුදල් ගෙවීම.**

2001 වර්ෂයේ දී මෙම නගර සභාවට මිළදීගත් ඉදිකිරීම් ද්‍රව්‍ය වෙනුවෙන් මුදල් ගෙවන ලෙස බලන්ගොඩ නිව්හැපි ස්ටෝර්ස් ආයතනය විසින් නිරන්තරයෙන් ඉල්ලීම් කරනු ලබන බවත්, ඒ පිළිබඳව කිසිදු ලියවිල්ලක් (SRN /ISSUE ORDER ඉල්ලීම් ලිපි/මිල කැඳවීමේ ලිපි) දැනට මෙම කාර්යාලයේ සොයාගත නොහැකි බවත්, අදාල ආයතනය විසින් ඉදිරිපත් කර ඇති බිල්පත් වල ජායා පිටපත් පමණක් දැනට කාර්යාලයේ ඇති බවත්, මෙම බිල්පත් සඳහා ගෙවීම් කිරීමට අනුමැතිය ඉල්ලමින් විෂයභාර නිලධාරිණිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපියක් සභාගත කරන ලදී.

බිල්පත් පරීක්ෂා කර බලා අදාල හිඟ මුදල ගෙවීම සුදුසු බවට තිරණය කරන ලදී.

05:07 **2009 වර්ෂය වෙනුවෙන් අයවැය ලේඛණය සකස් කිරීම:**

2009 වර්ෂය වෙනුවෙන් පිළියෙල කලයුතු අයවැය ලේඛණය සඳහා ඇතුළත් විය යුතු සංවර්ධන හා වෙනත් යෝජනා 2008.10.15 දිනට ප්‍රථම ලබාදෙන ලෙසත්,නවද මෙම යෝජනා අන්තර්ජාලයට ද ඇතුලත් කිරීමට අදහස් කරන බව සඳහන් කරමින් විෂය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර තිබූ ලිපියක් සභාගත කරන ලදුව,නම තමන් නියෝජනය කරනු ලබන කොට්ඨාස තුළ කල යුතු වූ සංවර්ධන යෝජනා හැකි ඉක්මණින් තමන් වෙත ඉදිරිපත් කරන ලෙස ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ගරු සභාපතිතුමා විසින් දැණුම් දෙන ලදී.

05:08 **නව නගර සංවර්ධනය සඳහා පවරාගෙන ඇති ඉඩම් තක්සේරු ලේඛණයෙන් ඉවත් කිරීම:**

නව නගර සංවර්ධන කටයුතු සඳහා පහත සඳහන් දේපල පවරාගෙන ඇති අතර, දැනට මෙම ඉඩම් හා ගොඩනැගිලි නොමැති බවත්, මෙම දේපල සඳහා වාර්ෂික වරිපනම් බදු බිල් කෙරෙන බැවින්, හිඟ මුදල් සමඟ හිමිකම් තක්සේරු ලේඛණයෙන් එකී දේපල ඉවත් කිරීම සුදුසු බවට වාර්තා කරමින්, ආදායම් අංශයෙන් ඉදිරිපත් කර තිබූ ලිපියක් සභාගත කරන ලදුව මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

**දොරවෙල පාර:**

| වරිපනම් අංකය | අයිතිකරුගේ නම | දේපල විස්තරය |
|---|---|---|
| 02 | ජී.එම්.මෙන්ඩිස් අප්පු | යකඩ බඩු කඩය |
| 06 | ජී.එච්.පබිලිස් | ඉඩම |
| 08 | කිරිගනිතා | ඉඩම |
| 10 | එච්.එල්.ගුණතිලක | ඉඩම |
| 12 | යු.බී.හතනා | ඉඩම |
| 14 | එච්.එල්.ගුණතිලක | ඉඩම |
| 16 | එමලින් හා ඇස්ලින් | ඉඩම |
| 18 | සුමනගුරු හා තවත් අය | ඉඩම |

**රත්නපුර පාර:**

| | | |
|---|---|---|
| 214 | සමුපකාරය,බලන්ගොඩ | ග්‍රොසරිය |
| 216 | ලංකා ගමනා ගමන මණ්ඩලය | බස්නැවතුම්පල කාර්යාලය. |

| | | |
|---|---|---|
| 216/3 | -එම- | උළු සෙවිලි ග්‍රොසරිය. |
| 216/4 | -එම- | උළු සෙවිලි බෙහෙත් සාප්පුව. |
| 216/4 1/1 | -එම- | ට්‍රේලර් සාප්පුව. |

05:09 **" ස්පෝර්ටින් ස්ටාර් " ( රේස් ඔට්ටු මධ්‍යස්ථානය පිහිටි ගොඩනැගිල්ල) සඳහා කුලී අයකිරීම**

රත්නපුර පාරේ අංක: 133 දරණ ගොඩනැගිල්ලේ උඩු මහලේ පවත්වාගෙන යන ස්පෝර්ටින් ස්ටාර් ( රේස් ඔට්ටු මධ්‍යස්ථානය සඳහා කිසිදු ගාස්තුවක් හෝ සහතිකයක් නිකුත් කර නොමැති බවත්, එබැවින් මෙය පවත්වාගෙන යාම හෝ නොදීම පිළිබඳ තීරණයක් ගැනීම සුදුසු බවට ආදායම් අංශයෙන් වාර්තා කර තිබුණු අතර, පනතේ නියමයන්ට අනුව අයකල යුතු වු ගාස්තුව අයකිරීමට සභාව තීරණය කරන ලදී.

05:10 **රාජ්‍ය උපහාර පැකේජය ලබාගැනීම:**

මොබිටෙල් ආයතනයෙන් " රාජ්‍ය උපහාර පැකේජය " ලබාගැනීම සඳහා එක් නිලධාරියෙකුට රු.1000/- බැගින් අත්තිකාරම් මුදල් ලබාදීමටත්, එම මුදල සමාන වාරික 05 කින් අයකර ගැනීමටත් විෂය භාර නිලධාරි විසින් ඉල්ලීමක් කර තිබුණු අතර, ඒ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:11 අලුතින් නගර සභා බලප්‍රදේශයට එක් වු දේපල තක්සේරු කරගැනීම

උක්ත කරුණට අදාළව ආදායම් අංශයෙන් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

අලුතින් නගර සභා බලප්‍රදේශයට එක් වු දේපල කඩිනමින් තක්සේරු කරගතහොත් 2009 වර්ෂයට ආදායම් වැඩිකරගත හැකි බවත්, එබැවින්, මේ සම්බන්ධයෙන් ඩබ්.ඒ.චන්ද්‍රසේකර තක්සේරු මහතාගේ නියෝජිත නිලධාරී කුලරත්න මහතා සමඟ සාකච්ජා කල අතර, ඔහු විසින් තක්සේරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇති අඩුම ටෙන්ඩර් මුදල වු රු.1185000/- ක මුදලට වඩා රු.200000/- ක් අඩුවෙන් මෙම කාර්යය ඉටුකිරීමට පොරොන්දු වන ලද අතර, බලන්ගොඩ නගර සීමාවේ පදිංචි අයෙකු වශයෙන් වගකීමෙන් යුතු හැකි ඉක්මණින් මෙම කාර්යය ඉටුකරදීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති හෙයින්, මේ පිළිබඳව සලකා බලන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

නැවත තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ සාකච්ජා කිරීමට සභාව තීරණය කරන ලදී.

05:12 **නිවාඩු අනුමත කිරීම:**

අත්‍යාවශ්‍ය රාජකාරි කටයුත්තක් යෙදී ඇති නිසා, අද දින පැවැත්වෙන සභා රැස්වීමට සහභාගිවිය නොහැකි බව ගරු උපසභාපති සුමේද චාමින්ද බස්නායක මැතිතුමා දුරකථනයෙන් දැණුම් දුන් බව සභාව වෙත දන්වන ලදුව, නිවාඩු අනුමත කිරීමට සභාව තීරනය කරන ලදී.

06. **මුදල් ගෙවීම් අනුමත කිරීම:** ( රු.10000/- ට වැඩි ගෙවීම්)

01. බී.ගුණරත්න මයා
    නගරයේ කසල එකතු කිරීම හා ප්‍රවාහනය

|  |  |  |
|---|---|---|
|  | කිරීම සඳහා මුදල් ගෙවීම | රු. 86500.00 |
| 02. | එම්.බී.ගුණරත්න මයා<br>වැලි කියුබ් 06 ක් සඳහා මුදල් ගෙවීම | රු. 24000.00 |
| 03. | සභාපති, තුඹගොඩ ගොවි සංවිධානය<br>පල්ලෙවෙල ළිඳ අසල අතුරු මාර්ගය<br>සංවර්ධනය කිරීම කර්මාන්තයේ 20%<br>අත්තිකාරම් ගෙවීම. | රු. 89284.00 |
| 04. | සභාපති,<br>තුඹගොඩ ගොවි සංවිධානය<br>සමගි මාවත ගරාජය අසලින් අතුරු<br>මාර්ගයේ වම්පස පාර අඩි 565 ක්<br>කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ 20%<br>අත්තිකාරම් මුදලක් ගෙවීම. | රු. 93664.00 |
| 05. | සභාපති,<br>තුඹගොඩ ගොවි සංවිධානය<br>සදුන්ගම පාර අවසන් කොටස කොන්ක්‍රීට්<br>කිරීම කර්මාන්තයේ 20% අත්තිකාරම්<br>පියවීම. | රු. 86149.00 |
| 06. | සභාපති,<br>තුඹගොඩ ගොවි සංවිධානය<br>නානායම් ගෙදරවත්ත පාර ඉදිරිපිට<br>වතු නිවාස හරහා යන ගම්සභා පාර<br>සංවර්ධනය කිරීම කර්මාන්තයේ අවසන්<br>ගෙවීම. | රු.124162.37 |
| 07. | දේශීය ආදායම් කොමසාරිස්<br>2008.07.01 සිට 2008.07.31 දක්වා<br>කාලයට වැට් බදු ගෙවීම. | රු. 86118.00 |
| 08. | ආනන්ද හාඩ්වෙයාර්<br>සිමෙන්ති මිටි 20 ක් ලබාගැනිම | රු. 16080.00 |
| 09. | එස්ඩීසීසී ස්ටීල් මර්චන්ට්<br>ජී.අයි.බට 20 ක් ලබාගැනීම. | රු. 18700.00 |
| 10. | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>දුරකථන බිල්පත් පියවීම.<br>87023- 2008 ජුනි/ජුලි<br>87022/88565/88400/060/2452932 | රු. 17958.44 |
| 11. | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>දුරකථන බිල්පත් පියවීම.-2008 ජුනි<br>87275/87153/86596 | රු. 17831.81 |
| 12. | Dax ඉංජිනියරින් කම්පැණි<br>බොබ් කැට් යන්ත්‍රය මීටර් පැය 500 සේවාව | රු. 33972.15 |
| 13. | ජේම්සිටි ට්‍රේඩර්ස්<br>නව තොරතුරු මධ්‍යස්ථානය වායු<br>සමීකරණය කිරීම. | රු. 305500.00 |
| 14. | සාමාන්‍යාධිකාරී,ලංකා විදුලිබල මන්ඩලය |  |

2008 ජුලි මස පොදු වෙළඳපල හා
ප්‍රේක්ෂකාගාරය විදුලිබිල්පත පියවීම. රු. 10776.00

15. එච්.එල්.ඩබ්.ඉංජිනියරින් සර්විසස්
ජේ.සී.බී.යන්ත්‍රයේ ඩිෆරන්සලය
අලුත්වැඩියාවට අවශ්‍ය ඔයිල් කෑන්
07 ක් මිලදී ගැනීම රු. 11865.00

16. ටී.කේ.සී.මුවංගල
සිමෙන්ති මිටි 30 ක් සැපයීම රු. 22672.80

17. සභාපති,
සුහද ග්‍රාම සංවර්ධන සමිතිය
ඉපිටපැන්න ඇස්සැද්දුම මාර්ගය කොන්ක්‍රීට්
කිරීම කර්මාන්තයේ අවසන් මුදල් ගෙවීම. රු. 145404.48

18. සභාපති,
තුඹගොඩ ගොවි සංවිධානය
සදුන්ගම පාර කොන්ක්‍රීට් කිරීම ii අදියර
කර්මාන්තයේ අවසන් ගෙවීම. රු. 432968.43

19. ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්
දුරකථන බිල්පත් පියවීම-2008 ජුලි
87275/87153/86596 රු. 20332.14

20. එල්.ඊ.සී.සී.මෙටල් ක්‍රෂර්
කර්මාන්ත අංශයට අවශ්‍ය ගල් මිළදී ගැනීම
( 6x9 / 1/2/1 1/2/ 3/4 ගල් කියුබ් 06 ) රු. 20515.50

21. නිහාල් ට්‍රේඩිං කම්පැණි
කර්මාන්ත අංශයට තීන්ත මිළදී ගැනීම රු. 23732.06

22. නිහාල් ට්‍රේඩින් කම්පැණි
කර්මාන්ත අංශයට තීන්ත මිළදී ගැනීම රු. 43853.04

23. ජයන්ති ටයර් සෙන්ටර්
කෘෂි කැබ් රථයට ටයර් 02 ක් මිළදී
ගැනීම.( ජී.අයි. ) රු.21200.00

24. ජයන්ති ටයර් සෙන්ටර්
කෘෂි කැබ් රථයට ටයර් 02 ක් මිළදී
ගැනීම.( රේන්ජ් ) රු.21325.006

25. එම්.ඩබ්.ලක්ෂ්මන් අබේසිංහ
ජී.අයි.3606 ටිපර් රථයෙන් ගල් ප්‍රවාහනය
සඳහා මුදල් ගෙවීම. රු.10000.00

26. සභාපති,
කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය
තුඹගොඩ කෝපිවත්ත රණවිලාවත්ත
මාර්ගය කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ
20% අත්තිකාරම් ගෙවීම. රු.109118.20

27. සභාපති,
කිරිදිගල ග්‍රාම සංවර්ධන සමිතිය
වැලිහරනාව අතුරු මාර්ගය සංවර්ධනය කර

කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ 20%
අත්තිකාරම් ගෙවීම. රු.114440.00

28. සමානාධිකාරි, ලංකා විදුලිබල මණ්ඩලය.
2008 ජුනි/ජුලි මාස වල ළදරු පාසල
පුස්තකාලය, ආයුර්වේදය විදුලි බිල්පත්
පියවීම. රු. 12145.50

29. සාමාන්‍යාධිකාරි
ලංකා විදුලිබල මණ්ඩලය 2008 ජුනි මස
පොදු වෙළඳසල හා ප්‍රේක්ෂකාගාරයේ
විදුලිබිල්පත් පියවීම. රු.11224.50

30. සාමාන්‍යාධිකාරි-ලංකා විදුලිබල මණ්ඩලය
2008 ජුනි / ජුලි මාස වල කාර්යාලයේ
විදුලි බිල්පත පියවීම. රු.26792.00

31. සාමාන්‍යාධිකාරි
සී.ස.ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය
2008.08.12 සිට 2008.08.20 දක්වා
ඉන්ධන බිල්පත් පියවීම. රු.95974.50

32. සාමාන්‍යාධිකාරි
සී.ස.ඉඹුල්පේ වි.සේ.ස.සමිතිය
2008.08.05 සිට 2008.08.14 දක්වා
ඉන්ධන බිල්පත් පියවීම. රු.91377.30

33. ඊ.ජී.චන්ද්‍රරත්න
පොහොර කි.ග්‍රෑ.10000 ක් හැලීම
වෙනුවෙන් ගාස්තු ගෙවීම. රු.10000.00

34. පරිපාලන සම්බන්ධීකරණ ලේකම්
රාස්සගල ගොවිජන සංවර්ධන සභාව
සෙවන දැල් 84 M 2 මිළදී ගැනීම රු.10920.00

35. සී.ස.ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස්
තොරතුරු මධ්‍යස්ථානයට කබඩ් 01
මේසයක් හා පුටුවක් මිළදී ගැනීම. රු.55189.82

36. සාමාන්‍යාධිකාරි
සී.ස.ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර
සමිතිය. සිමෙන්ති මිටි 30 ක් ලබාගැනීම. රු.22950.00

37. බී.ගුණරත්න
2008.08.15 ජ 2008.08.30 දක්වා
කාලයට නගරයේ කසල එකතු කිරීම
හා ප්‍රවාහනය වෙනුවෙන් මුදල් ගෙවීම. රු. 86500.00

38. සභාපති,
නාගරික සමෘද්ධි බලකාය.
සිටිගාඩින් පාර කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ
පළමු කොටස් ගෙවීම. රු. 119945.82

39. කළමණාකරු
සමෘද්ධි බැංකු සංගමය-දෙපැලමුල්ල.
පහල කිරිමැටිතැන්න පුෂ්පාරංජනී මියගේ
නිවස අසල බෝක්කු දෙක හා පැති බැම්ම

ඉදිකිරීම කර්මාන්තයේ I කොටස් ගෙවීම. රු. 93008.38

40. කළමණාකරු
සමෘද්ධි බැංකු- සංගමය.බලන්ගොඩ
කරවිකැටිය ගල්වල පාර කොන්ක්‍රීට් කිරීම
කර්මාන්තයේ 20% අත්තිකාරම් ලබාදීම. රු. 118.923.53

41. කළමණාකරු සමෘද්ධි බැංකු සංගමය
බලන්ගොඩ.
කොටුගොඩැල්ල සිට දෙහිපිටිඇල්ල දක්වා
මාර්ගය කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ
20% අත්තිකාරම් ලබාදීම. රු. 74202.00

42. එල්.ඊ.සී.සී.මෙටල් ක්‍රෂර්
4x4 ගල් කියුබ් 15 ක් මිළදී ගැනීම. රු. 60066.00

43. ජෝති ස්ටෝර්ස්
කාර්යාල ලිපි ද්‍රව්‍ය මිළදී ගැනීම. රු. 10313.00

44. එම්.ජී.පියසේන
එකතු කරන ලද බස්ගාල් ගාස්තු වලින්
කොමිස් මුදල් ගෙවීම. රු. 20250.00

45. කලම්බෝ ලෙදර් ප්‍රයිවට් ලිමිටඩ්
තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයට
කාපට් මිළදී ගැනීම. රු. 34996.50

46. කළමණාකරු
සමෘද්ධි බැංකු සංගමය,බලන්ගොඩ.
සුදර්ශනගම I පටුමග කොන්ක්‍රීට් කිරීම
කර්මාන්තයේ වැඩ අවසන් බැවින් මහා මාර්ග
අමාත්‍යාංශයෙන් මුදල් ලැබෙන තෙක්
අත්තිකාරම් ගෙවීම රු. 150000.00

47. සාමාන්‍යාධිකාරී.
සී.ස.ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය
2008.08.20 සිට 2008.08.27 දක්වා ඉන්ධන
බිල් පියවීම. රු. 113951.30

48. සභාපති, තුඹගොඩ ගොවි සංවිධානය
සමගි මාවත ( අක්කර 18 ) ගරාජය
අසලින් අතුරු මාර්ගය ඉහල වම්පස පාර
අඩි 565 ක් කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ
අවසන් ගෙවීම. රු. 406240.83

49. ශ්‍රී ලංකා ටෙලිකොම්
මන්ත්‍රීවරුන්ගේ දුරකථන බිල්පත් පියවීම.

| | |
|---|---|
| 87022 | - 2008 ජුලි |
| 88565 | - 2008 ජුලි |
| 87024 | - 2008 ජුනි,ජුලි |
| 88400 | - 2007 දෙසැ.2008 ජුලි |
| 060- 2452931 | - 2008 ජුනි.ජුලි |
| 060-2452930 | - 2008 ජුලි |
| 060-2452939 | -2008 මැයි.ජුනි.ජුලි |

රු.26643.06

50. එච්.එල්.ඩබ්.ඉංජිනියර්ස් සර්විස්
ජේ.සී.බී.යන්ත්‍රයට ලූකස් බැටරියක් මිළදී

ගැනිම. රු.17185.00

51. ටි.කේ.සි.මුවංගල
සිමෙන්ති මිටි 15 ක් මිළදි ගැනිම රු.12060.00

52. නිහාල් ට්‍රේඩිං කම්පැණි
කර්මාන්ත අංශයට තින්ත මිළදි ගැනිම. රු.13826.96

53. ඩි.නිමල් චන්ද්‍රසිරි මධුෂානි
එන්ටර්ප්‍රයිසස්
ආයුර්වේද ගොඩනැගිල්ල තොරතුරු තාක්ෂන
මධ්‍යස්ථානයක් බවට පත්කිරීමේ කර්මාන්තයේ
ඇලුමිනියම් දොර,ජනෙල් යෙදීම. රු.52947.50

54. සාමාන්‍යාධිකාරි
සි.ස.ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය.
සිමෙන්ති මිටි 300 ක් මිළදි ගැනිම. රු.235500.00

55. සාමාන්‍යාධිකාරි
සි.ස.ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය.
2008.08.23 සිට 2008.08.30 දක්වා ඉන්ධන
බිල්පත් පියවිම. රු.60726.90

56. සභාපති, තුඹගොඩ ගොවි සංවිධානය
පල්ලෙවෙල ලිඳ අසල අතුරු මාර්ගය
සංවර්ධනය කිරිම/සමගි මාවත.අක්කර 18
ගරාජය අසලින් අතුරු මාර්ගය ඉහල
චම්පස පාර කොන්ක්‍රිට් කිරිම/සදුන්ගම පාර
iV වන අදියර කොන්ක්‍රිට් කිරිම කර්මාන්ත වල
ටෙන්ඩර් ඇප තැන්පත් නිදහස් කිරීම. රු.18500.00

57. තෙබුවන ගරාජය
ජේ.සි.බී.යන්ත්‍රයේ බුට් එක කැලී දමා වැල්ඩින්
කිරිම.බ්‍රකට් එක කපා ඇඳ හැර වැල්ඩින් කිරීම
ඉදිරිපස පරණ දත් ගලවා අලුතින් දත්
දැමීම. රු.22500.00

58. සභාපති,ග්‍රාම සංවර්ධන සමිතිය,කිරිදිගල
වැලිහරනාව අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරිම
කර්මාන්තයේ ලංසු ඇප තැන්පත් ආපසු ගෙවිම රු.15500.00

59. ඊ.ජී.චන්ද්‍රරත්න
පොහොර කි.ග්‍රෑ.10000 ක් හැලීම වෙනුවෙන්
මුදල් ගෙවිම. රු.10000.00

60. බි.ගුණරත්න
2008.09.01 - 2008.09.15 දක්වා නගරයේ
කැලි කසල එකතු කිරිම හා ප්‍රවාහනය
වෙනුවෙන් මුදල් ගෙවිම. රු. 86500.00

61. සාමාන්‍යාධිකාරි,ලංකා විදුලිබල මණ්ඩලය
2008 ජුලි මස බස්නැවතුම්පල විදුලි බිල්පත
පියවිම. රු.41080.20

62. කළමණාකරු, ජල සම්පත් මණ්ඩලය

2008 ජුනි මස බස්නැවතුම්පල ජල බිල්පත
පියවීම. රු.32631.00

63. කළමණාකරු, ජල සම්පත් මණ්ඩලය
2008 ජුලි මස බස්නැවතුම්පල ජල බිල්පත
පියවීම. රු.33658.00

64. දේශීය ආදායම් කොමසාරිස්
වැට් බදු මුදල් ගෙවීම. රු.41260.00

65. සාමානාධිකාරි,ලංකා විදුලිබල මණ්ඩලය.
2008 අගෝස්තු මස බස්නැවතුම්පල
විදුලි බිල්පත පියවීම. රු.40280.40

66. කළමණාකරු,
ජල සම්පත් මණ්ඩලය,2008 අගෝස්
මස බස්නැවතුම්පල ජල බිල්පත පියවීම රු.37443.50

67. කළමණාකරු,මහජන බැංකුව
ලංකා බැංකුවෙන් මුදල් මාරුකිරීම. රු.500000.00

68. එන්.එස්.ලියනගේ රු.887073.03

69. දේශීය ආදායම් කොමසාරිස්
වැට් බදු ගෙවීම. රු.40691.43

70. එන්.එස්.ලියනගේ රු.560802.71

71. දේශීය ආදායම් කොමසාරිස්
වැට් බදු මුදල් ගෙවීම. රු.71596.45

72. දේශීය ආදායම් කොමසාරිස්
වැට් බදු මුදල් ගෙවීම. රු. 1431.29

73. සී.ස.කියැන්නැම් එන්ටර්ප්‍රයිසස් රු.19537.49

74. දේශීය ආදායම් කොමසාරිස්
වැට් බදු මුදල් ගෙවීම. රු.42102.00

ඉහත සදහන් මුදල් ගෙවීම් සියල්ල සභාව විසින් අනුමත කරන ලදි.

07. <u>ඇස්තමේන්තු අනුමත කිරීම:</u>
නගර සභා ගොඩනැගිල්ලට යාබඳව මල් සිටුවා ආරක්ෂා කිරීම සදහා
අලංකාර මඩු සැකසීම රු. 52200/-
මේ සදහා සභාවේ ආවරණ අනුමැතිය ලබාදෙන ලදි.

08.1 <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ</u> : නැත

11.<u>යථා පරිදි කල් දී ඇති යෝජනා:</u> නැත

09. <u>ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම</u>:
බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කසල කළමණාකරණ කටයුතු සදහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම හා පොළව කොන්ක්‍රීට් කිරීම iV අදියරෙහි වැඩ ආරම්භ කිරීම සදහා 2008.09.19 දින පවත්වනු ලැබූ ප්‍රසම්පාදන කමිටුවේ වාර්තාව හා බලන්ගොඩ මහජන පොළ ඉදිකිරීම 1 අදියර සදහා ද

2008.09.10 වන දින පවත්වන ලැබූ ප්‍රසම්පාදන වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදුව, එම වාර්තා සභාව විසින් අනුමත කරන ලදී.

10. <u>යෝජනා</u>

10:01 සභා යෝජනාවක් මත කුමාරගම පන්සලට ජලය ලබාදීම සඳහා ප්ලාස්ටිසෙල් ජල ටැංකියක් හා වතුර මොටරයක් මිලදී ගෙන තිබෙන බවත්, ඒ සඳහා ගෙවිය යුතු වූ මුදල පියවීමට කටයුතු කරන ලෙස ගරු සභා මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ඉල්ලා සිටින ලදුව, අදාල බිල්පත පියවීමට සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙන ලදී.

11. <u>කාරක සභා වල වාර්තා සලකා බැලීම</u>:

2008.09.01 වන දින පවත්වන ලද කර්මාන්ත කම්ටු රැස්වීමේ වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදුව, එම වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

- 2008.08.01 දින සිට 2008.08.30 දින දක්වා වැය වූ ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදුව, සභාව විසින් එය සම්මත කරන ලදී.

12. <u>ආදායම් වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත්කිරීම:</u>

2008 අගෝස්තු මාසයට අදාල ආදායම් හා වියදම් වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

පුනරාවර්තන ගෙවීම්
වෙනත් ලැබීම්

-----------

මුළු ලැබීම්

========

ගෙවීම්-2008 අගෝස්තු

පුනරාවර්ථන ගෙවීම්
ප්‍රාග්ධන ගෙවීම්
වෙනත් ගෙවීම්

----------

මුළු ගෙවීම්

========

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

13. <u>වෙනත් කරුණු:-</u>

වෙනත් කරුණු කිසිවක් සාකච්ඡා නොවිය.

14. <u>අවසානය:</u>

<u>ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා:</u>

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනාටත්,ප්‍රධාන කළමණාකරණ සහකාර නිලධාරි මහත්මියටත් සිය ස්තූතිය පුදකරමින්, ප.ව.12.00 ට පමණ රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.